**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ශයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසු ගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂයේ එකතුව රු. 387,973,060ක් වුවත් සමාලෝචිත වර්ෂයේ ආරම්භක මූල්‍ය නොවන වත්කම් ශේෂ එකතුව රු.402,290,861 ක් වුයෙන් රු. 14,317,801 වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම්වල ආරම්භක ශේෂය හා වත්කම් අගය කිරීම් නිවැරදිව සටහන් කළ යුතුය | 2018.12.31 දිනට පැවති ශේෂය 2019 වර්ෂයේ CIGAS වැඩසටහන මඟින් ලබාගත් මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයට සමාන නොවීමට හේතු දෙකක් ඇත.<br>i. කාර්යාල ගොඩනැඟිලි කෙරීගෙන යන වැඩ (WIP) ශේෂය 2018.12.31දිනට රු.22,511,639 ක් සහ 2019 වර්ෂයේදී එම ඉදිකිරීමට අදාළව කරනු ලැබූ වියදම රු.37,371,226 ක් වූ අතර මුළු වියදම රු.59,882,865 කි.එම මුදල 2019.12.31 දිනට WIP මඟින් ගොඩනැඟිලි වත්කම් වලට මාරු කරන ලදි. එබැවින් 2019.12.31 ට CIGAS වැඩසටහන මඟින් ලබාගත් මූල්‍ය නොවන වත්කම් |

ප්‍රකාශනයේ වර්ෂය තුළ කාර්යාල ගොඩනැඟිලි යටතේ ඉදිරිකිරීම් ලෙස රු.59,882,865 ක් සටහන් වී ඇත.

ii. 2019 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රාදේශීය කාර්යාල වල වත්කම් අගය කිරීමට ලක් කල අතර රු.5,000 ට වැඩි සියළු වටිනාකම් එකතුව රු. 36,839,440ක් ලෙස ආරම්භක ශේෂ යටතේ මූල්‍ය නොවන වත්කම් වලට ඇතුලත් කරන ලදි. එමනිසා රු. 14,317,801 ක් ලැබී ඇත්තේ ඉහත රු.22,511,639 හා රු. 36,829,440 යන අගයන් ගැලපීම මඟිනි.

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බ්‍රවුන්ස් සහ සමාගම සම්බන්ධයෙන් වන රු. 329,590 ක වටිනාකමකින් යුත් සමාලෝචිත වර්ෂයට අදාල බැරකම මුලධන වියදම් වැය විෂයක් වන 291-1-1-0-2003 යටතේ හඳුනාගෙන ඇති අතර 2020 වර්ෂයේ දී එය 291-1-1-0-1409(වෙනත්) යන පුනරාවර්ථන වැය විෂය යටතේ නිරවුල් කර තිබුණි. ඒ සඳහා මුදල් රෙගුලාසි | අදාළ වැය විෂයන් යටතේ හඳුනාගන්නා ලද බැරකම් එම වැය විෂයන් යටතේම ගෙවීම් කළ යුතු අතර වෙනත් වැය විෂයක් යටතේ ගෙවීම් කරන්නේ නම් ඒ සඳහා මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමට ක්‍රියා කළ යුතුය. | 2019 වර්ෂයේ ඉතිරි වූ ප්‍රතිපාදන මත බ්‍රවුන්ස් සහ සමාගම ඇතුළු ආයතන 5 ක රු. 921,330 ක බැදීම් ඇති කරගත් නමුත් ඒවා ගෙවා නිරවුල් කිරීමට ප්‍රමාණවත් අක්මුදල් 2019 මූල්‍ය වර්ෂය තුල නොලැබිණි. 2020 වර්ෂයේ ජනවාරි මාසයේදී 291- 1- 1 - 0-2003 වැය විෂයය යටතේ ලැබුණේ රු.500,000 ක් පමණි. |

| | | |
|---|---|---|
| 66/69 යටතේ වැය විෂයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමට අවසර ලබා ගෙන නොතිබුණි. තවද සිම්පල් ඉංජිනියරින් (පෞද්) ආයතනයේ සමස්ථ බැරකම් ලෙස 291-1-1-0-2003 වැය විෂය යටතේ රු. 220,016ක් ලෙස හඳුනාගෙන ඇති අතර ඒ සඳහා රු. 265,800ක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව බැරකම් ලෙස හඳුනා ගැනීමකින් තොරව රු. 45,784ක් ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය විය. | | අළුතින් වැඩ කරවාගැනීම සඳහා පැරණි බිල්පත් නිරවුල් කිරීමට සිදුවූ බැවින් ඒ වනවිට ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු 291-1-1-0-1409 වැය විෂයයෙන් බ්‍රවුන්ස් සහ සමාගමේ බිල්පත පියවීමට කටයුතු කර ඇත. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අංක 03/2015 හා 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම වී දින 10ක් ඇතුළත අතුරු අග්‍රිමය ගිණුම් අංශයට පියවිය යුතු වුවත් එසේ නියමිත දිනට පියවීමට කටයුතු කර නොමැති එකතුව රු.883,540 වූ අවස්ථා 24 ක් නිරීක්ෂණය වූ අතර එම අග්‍රිම පියවීම දින 13ත් මාස 05 දින 20 ත් අතර කාල ප්‍රමාදයකින් සිදු කර තිබුණි | කිසියම් කාර්යයක් සඳහා ගනු ලබන තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය නිම කළ වහාම චක්‍රලේඛය ප්‍රකාරව පියවීමට කටයුතු කළ යුතුය. | ජාතික වැඩසටහන්, විශේෂ වැඩසටහන් හා යෝජිත වැඩසටහන් සිදුකිරීමේදී ඒවා සාර්ථක කරගැනීම සඳහා යම් නිශ්චිත කාලයක් තුළ ක්‍රියාත්මක කර අවසන් කල යුතුව ඇත. එහිදී මාණ්ඩලික නොවන නිලධාරීන් සිදු කෙරෙන වැඩ කොටස් සඳහා අවශ්‍ය වන අත්තිකාරම් මුදල් ඔවුන් නමින් ලබාගත නොහැකි බැවින්, අදාළ අත්තිකාරම් මුදල් මාණ්ඩලික නිලධාරියකු නමින්ම ලබාගැනීමට සිදුව ඇත. එබැවින් අදාළ එක් නිලධාරියකු අත්තිකාරම් මුදල් කිහිපයකින් අදාළ වැඩ නිම කිරීමට සිදුවූ බැවින් කාල ප්‍රමාදයකින් යුතුව අත්තිකාරම් මුදල් පියවූ අවස්ථා නිරීක්ෂණය වි ඇති බවත් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් අවම කරගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නිසි සැලසුමකින් තොරව රු.17,451,352 කට ඇස්තමේන්තු කර තිබූ රු. 16,191,911ක් වැය කරමින් ඉදි කළ කොග්ගල වෙරළ උද්‍යානය සඳහා සකස් කර තිබූ ආරම්භක ව්‍යාපෘති සැලැස්ම වෙනස් කරමින් එහි ඇතුළත්ව තිබූ ඇවිදින මං තීරුවේ අමුද්‍රව්‍යයන් හා නිර්මාණ වෙනස් කර තිබුණි. තවද ආපනශාලාව ඉවත් කර ඇස්තමේන්තු කර තිබූ කඩ කාමර 06ක ප්‍රමාණය 02 දක්වා අඩු කර තිබුණු අතර ගේබියන් බැම්ම හා පාලම ඉදිකිරීම සංශෝධනය කර කානු පද්ධතියක් ඊට ඇතුළත් කර තිබුණි. තවද කොන්ත්‍රාත්කරු සමඟ ඇති කර ගත් ගිවිසුමේ කොන්ත්‍රාත් වටිනාකම, අවසන් කළ යුතු දිනය, කාර්යය සාධන බැඳුම්කර හා ප්‍රමාද ගාස්තු පිළිබඳ විස්තර කිසිවක් ඇතුළත් කර නොතිබුණි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම නිසි පරිදි ව්‍යාපෘතිය සැලසුම් කළ යුතු අතර සුළු වෙනස් කම් සිදු කිරීම ගැටළු සහගත නොවූ නමුත් මේ ආකාරයෙන් ව්‍යාපෘතිය පවත්තාගෙන යන අතරතුර විශාල වෙනස්කම් සිදු කිරීම තුළින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වීම පිළිබඳව ගැඹුරින් සොයා බැලිය යුතු වීම. | වෙරළ උද්‍යාන සැලැස්ම සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමට ලක් කර නොමැති අතර එහි ප්‍රධාන අභිප්‍රාය/ අරමුණ(Scope) වෙනස් කර නොමැත. නමුත් ප්‍රසම්පාධිත අස්ථිත්වයේ අවශ්‍යතාවය පරිදි අභිප්‍රාය වෙනස් කර නොමැතිව අමුද්‍රව්‍ය හෝ වැඩ අයිතම වෙනස් කිරීමට හැකියාව ඇත. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් අනවසර ඉදිකිරීම් සිදු නොවන පරිදි නියාමන කටයුතු සිදු කළ යුතු වුවද 2015 සිට 2019 වර්ෂය දක්වා හඳුනා ගන්නා ලද මුළු අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව 1344ක් විය. වැඩිම අනවසර ඉදිකිරීම් ප්‍රමාණයක් ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්ක තුළින් වාර්තා විය. ඉන් කඩා ඉවත් කිරීම සඳහා නියෝග 1163ක් ලබා දී තිබුණද ඉන් කඩා ඉවත් කර තිබුණේ 214ක් පමණි. එය සියයට 18ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයකි. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර කඩා ඉවත් කිරීමට නියෝග දී තිබූ නමුත් කඩා ඉවත් නොකළ ඒවා, ඊට හේතු වූ කරුණු පදනම් කරගෙන වෙන් වෙන්ව වර්ග කර හඳුනා ගෙන නිසි පියවර කඩිනමින් ගත යුතුය. | ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හා අලුතින් ඇති වන ඉදිකිරීම් වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති නමුත් සමාජීය ගැටළු, සංචාරකයන් පැමිණෙන කාල වලදී, දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය වැඩ සටහන් හා ජාතික වැඩ සටහන් සිදු කිරීමේ දී මෙන්ම අදාළ කාර්යයට මුදල් ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකි වීම යන හේතුන් මත මන්දගාමී වී ඇත. |
| (ආ) | ඒ ඒ වෙරළ තීරයන් සඳහා වැවෙන ශාක වර්ග හඳුනා ගනිමින් එම ශාක වෙරළ තීරයන් සඳහා වගා ව්‍යාපෘති ආරම්භ කර තිබූ අතර 2016 සිට 2018 වර්ෂය දක්වා ඒ සඳහා දරා තිබූ වියදම රු.5,588,897 ක් විය. ව්‍යාපෘති මනා සැලසුමකින් තොරව ආරම්භ කිරීම හා ව්‍යාපෘති ක්‍රියාත්මකවන කාලය තුළ අධීක්ෂණ කටයුතු හා කාර්යසාධනය පිළිබඳ පසු විපරමක් දෙපාර්තමේන්තුව විසින් නිසි පරිදි සිදුකර නොතිබීම වැනි කරුණු නිසා එම ව්‍යාපෘති අසාර්ථක වී තිබුණි. | ව්‍යාපෘතියක් මනා සැලැස්මකින් යුතුව ආරම්භ කළ යුතු අතරම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය තුල නිසි අධීක්ෂණයක් සහ අවසන් වූ පසු එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුවී දැයි පසු විපරම් කල යුතුය. | ඒ ඒ වෙරළ තීරයන් සඳහා වැවෙන ශාක වර්ග හඳුනා ගනිමින් එම ප්‍රදේශවලට සුදුසු පැළ වර්ග වගා කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන වල සහයෝගය හා අධීක්‍ෂණය යටතේ මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වල මූලික මැදිහත් වීම මත 2016 හා 2018 වලදී වෙරළ කලාපයේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. කෙසේ වුවද එම කාලය තුල ඇති වූ යම් යම් දේශගුණික හා කාලගුණික බලපෑම් මත වෙරළ ආශ්‍රිත ශාක සඳහා දැඩි බලපෑමකට ලක් විය. එබැවින් දෙපාර්තමේන්තුව විසින් මනා සැලසුමකින් යුතුව අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කලත් අපේක්‍ෂිත මට්මකට ලඟාවීමට නොහැකි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෙරළ සංරක්ෂණ ඉදිකිරීමක් නිර්මාණයේදී හා ඉදිකිරීමේදී ඉංජිනේරුමය දත්ත විශාල සංඛ්‍යාවක් හා පරිසරයේ භූ විෂමතා ආදී කරුණු යොදාගෙන අවශ්‍ය අවධානය යොමුකර ඉදිකිරීම් සිදු කරනු ලබන බව දෙපාර්තමේන්තුව සඳහන් කර තිබුණි. එහෙත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම නිසා එක් ස්ථානයක වෙරළ සංරක්ෂණ ඉදිකිරීමක් සිදු කළ විටක ඒ ආශ්‍රිතව තවත් තැනක ඛාදනය ඇති වීමත් එම ස්ථානයේ ග්‍රොයිනයක් /දියකඩනයක් හෝ ගල්වැටියක් දැමූ විට ඉන් එහා තවත් තැනක් ඛාදනයක් සිදු වීමත් එම ස්ථානයේ තවත් ගල් වැටියක් හෝ ග්‍රොයිනයක් ඉදිකිරීමත් යන ආකාරයට දිගින් දිගටම ඉදිකිරීම් සිදු කරමින් පැවතුණද ඒවා වෙරළ ඛාදනය වැලැක්වීමට නිසි පිළියම් නොවීය. | වෙරළ සංරක්ෂණ ඉදි කිරීමක් සිදු කිරීමට ප්‍රථම එම ඉදි කිරීම හේතුවෙන් ඇති වන පාරිසරික බලපෑම පිළිබඳ තන්සේරුවක් ලබා ගැනීමට ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතුය. එවිට ඇතිවන බලපෑම අවම කර ගනිමින් ඉදිකිරීම සැලසුම් කිරීමට හැකියාවක් ලැබේ. | පනත හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම මඟින් වෙරල සංරක්ෂණ කටයුතු සඳහා ඉංජිනේරුමය ඉදිකිරීම් සඳහා පාරිසරික අධ්‍යයනයක් වෙනමම සිදු කිරීම නිදහස් කර තිබේ. වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හැරුණු විට මේ සඳහා වෙනත් සුදුසු ආයතනයක් සොයා ගැනීමද අපහසු කාර්යයකි. |
| (ඈ) | කළුතර කැලිඩෝව අසල වැලි පරය කපා දැමීම නිසා ඇති වූ වෙරළ ඛාදන තත්ත්වයන්ට පිළියම් වශයෙන් 2017 වර්ෂයේ සිට රු. 65,570,338ක් වැය කරමින් ගල්වැටි, ග්‍රොයින හදිසි ඛාදනයට ගල් දැමීම වැනි කටයුතු සිදු කර ඇති අතර ඉන් සිදුවන අතුරු ඵලයන් පිළිබඳව පාරිසරික අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. එමනිසා අපේක්ෂිත අරමුණු ඉටු නොවීම හා ශීඝ්‍රයෙන් වෙනස් වන පාරිසරික තත්ත්වයන්ට මුහුණ දීමට නොහැකි වී තිබුණි. ඊට අමතරව වැලි පෝෂණ ව්‍යාපෘතිය මඟින් යුරෝ 4,406,100 ක් වටිනා වැලි කියුබ් ලක්ෂ 08 ක් යොදා ගනිමින් වෙරළ තීරයක් ඇති | ඉදිකිරීමක් හෝ සංවර්ධන කාර්යයක් සිදු කිරීමට ප්‍රථම පාරිසරික අධ්‍යනයක් සිදු කර එම ව්‍යාපෘතිය හේතුවෙන් පරිසරයට වන බලපෑම නිර්ණය කළ යුතු අතර පරිසර වේදීන්ගේ අදහස් අනුව වැලි පොම්ප කිරීමේ දී එය අදියර 03කින් සිදු කළ යුතු වේ. ඒ අනුව වෙරළේ රළ තරංග වල සැර බාල කිරීම සඳහා පළමු අදියර ලෙස ගල් වැටියක් ඉදි කිරීම කර දෙවන අදියර ලෙස කඩොලාන වැවීම හා තුන්වන අදියර ලෙස වැලි පොම්ප කිරීම සිදු කළ යුතු වේ. | කළුතර කැළිඩෝව අසළ වෙරළ තීරයේ ඇතිව තිබෙන ඛාදන තත්ත්වය ඉතා අධික ගංවතුර තත්ත්වයන් සහ අහිතකර කාලගුණික තත්ත්වයන් සමඟ ක්ෂණිකව ඇතිවූ තත්ත්වයක් වන අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය පිළියම් සිදුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| | කිරීම සඳහා කැලිඩෝව හා ගල්කිස්ස වෙරළ තීරයේ සිදු කර තිබූ වැලි පොම්ප කිරීමෙන් අපේක්ෂිත අරමුණ ඉටු නොවී තවදුරටත් වෙරළ ඛාදනය වෙමින් පවතින බව නිරීක්ෂණය විය.මේ වන විට රු.356,526,076 ක මුදලක් ගෙවා ඇති අතර ඉතිරිය ගෙවිය යුතු මුදලක් ලෙස පැවතුණි. | | |
| (ඉ) | ගල්වැටි ඉදි කිරීමේදී මුහුදු මට්ටමෙන් පහළ කොටසට මිශ්‍රගල්ද මුහුදු මට්ටමෙන් ඉහළ කොටසට ටොන් 1 ½ -2 ½ ක් වන කුට්ටි ගල්ද යෙදිය යුතු වුවත් පිළිවෙලින් රු.2,394,351ක් හා රු.7,642,016ක් වැයකරමින් ඉදිකළ උස්වැටකෙයියාව හා දූන්ගල්පිටිය ගල්වැටි ඉදි කිරීමේදී මුහුදු මට්ටමෙන් ඉහළ කොටසට ද මිශ්‍රගල් යොදා තිබූ අතර මේ හේතුවෙන් මිශ්‍රගල් මුහුදට ගසාගෙන ගොස් තිබුණි. මේ අනුව සම්පත් උපරිම ගුණාත්මක තත්ත්වයෙන් යොදා නොගැනීම නිසා අපේක්ෂිත නිමවුමක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | යම් ඉදිකිරීමක් සිදු කිරීමේ දී නිසි ප්‍රමිතයෙන් යුතුව සිදු කළ යුතුය. | උස්වැටකෙයියාව සහ දූන්ගල්පිටිය වැඩබිම් ස්ථාන දෙකම ඉතා හදිසියේ ඇතිවූ වෙරළ ඛාදන තත්ත්වයන්ට පිළියම් යෙදූ ස්ථාන දෙකකි. මෙම හදිසි වෙරළ ඛාදන තත්ත්වයට පිළියම් යෙදීමේදී බොහෝවිට මිශ්‍රගල් පමණක් උපයෝගී කරගන්නා අතර කාලයත් සමඟ වෙරළ ඛාදනය සමනය වී එම ස්ථාන නැවත යථා තත්ත්වයට පත්වේ. කෙසේ වෙතත් එම හදිසි ඉදිකිරීම් නැවත ගලවා දැමීමක් සිදු නොවේ. |

**3.3 ප්‍රසම්පාදනයන්**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | -------------- | ------------------------- |
| (අ) | භුසළු මිල දී ගැනීම සඳහා ලංසු ලියවිලි පිළියෙල කිරීමේදී, අයිතමයේ ආනයන මිලට අමතරව දැරීමට සිදුවන සියළු වියදම් නිවැරදිව හඳුනාගත යුතු අතර එම | තෝරා ගන්නා ලද සැපයුම්කරුවන් | ජයග්‍රාහී සැපයුම්කරු භාණ්ඩ රැගෙන විත් භාර දිය යුතු බව ලංසු ලියවිලි වල |

වියදම් සැපයුම් සමාගම වෙත ගෙවන්නේ නම් එම වියදම් පිළිබඳ විස්තර ද ලංසු ලියවිල්ලේ ඇති පිරිවැය විස්තරය තුළ ඇතුළත් විය යුතු විය. එහෙත් භූ සළු වර්ග මීටර් 40,000ක් මිල දී ගැනීමේ දී දැරූ පහත සඳහන් වියදම් ලංසු ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි.

| වියදම් විස්තරය | වටිනාකම (රු.) |
| --- | --- |
| ආශා ෂිපින් ලයින් ගාස්තු | 66,714 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ගුදම් ගාස්තු | 60,106 |
| කලම්බො ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ ගාස්තු | 192,374 |
| රන්ක් කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ ගාස්තු (කන්ටේනර් පරීක්ෂන ගාස්තු) | 24,134 |
| ආශා ෂිපින් ලයින් ගාස්තු | 113,085 |
| දිවයින තුළ ප්‍රවාහන හා පැටවීමේ ගාස්තු | 232,500 |
| | 688,913 |

වෙත ගෙවන ලද සියළු වියදම් ලංසු ලියවිලිවල ඇතුලත් කළ යුතුය.

ඇතුළත් කර ඇති අතර ඒ සඳහා දැරීමට සිදු වන රේගු ගාස්තු, වරාය ගාස්තු, පරීක්ෂණ ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමේ පටිපාටිය අනුගමනය කරමින් අදාළ ආයතන වල මූලික ඉන්වොයිස් වලට අදාළ වන පරිදි පමණක් ගෙවීම් සිදු කර ඇත.මෙම ගාස්තු කවර සැපයුම්කරුවෙකු විසින් සිදු කරනු ලැබුවද අදාළ ආයතන රේට් ගණනය කිරීම් නොවෙනස්ව පවතී.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය ප්‍රකාරව රු. 250,000ක් ඉක්ම වූ වැඩ සඳහා දෙපාර්ශවය අතර ගිවිසුමක් ඇති කර ගත යුතු විය. එහෙත් මැඩිල්ල දියකඩනය ඉදිකිරීම සඳහා කුලී පදනම මත රු. 450,000ක කළුගල් ලෝඩරයක් ලබා ගැනීමට හා කැපුන්ගොඩ ග්‍රොයින 3ක් ඉදිකිරීමට යන්ත්‍ර හා වාහන කුලියට ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු.958,500ක කොන්ත්‍රාත්තු ලබා දී තිබුණද ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ගිවිසුම් වලට එළඹිය යුතුය.

යන්ත්‍ර සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමක් මින් පෙර සිදු කර නොමැති අතර එය පසුව නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත

**3.4 හානි හා පාඩු**

**---------------**

හානි හා පාඩු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 104(1)(අ) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමක් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් PD- 4249 අංක දරන රථයට සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | PD-4249 කැබ් රථය 2019.09.24 දින අනතුරට ලක්වූ අතර, 2019.10.31 දින අනතුර සම්බන්ධ පොලිස් වාර්තාවක් ලබා ගෙන ඇත. (පොලිස් වාර්තාව ලබා ගැනීමට ප්‍රමාද වී ඇත්තේ රස පරික්ෂක වාර්ථාව ලබා ගැනීමට රථය තබා ගත යුතු බව පොලිස් ස්ථානය මඟින් දැනුම් දීම නිසා වේ. පසුව පොලිස් ස්ථානාධිපති සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව පොලිස් වාර්තාව ලබා දී ඇත)පසුව රථයේ අනතුරට ලක් වී තිබූ වින්ස්ක්‍රීන් අළුත්වැඩියාව සඳහා සමරසිංහ මෝටර්ස් මඟින් මිල ගණන් කැඳවූ අතර, තොග අවසන් වීම හේතුවෙන් අදාල වර්ගයේ වින්ස්ක්‍රීන් සමරසිංහ මොටර්ස් ආයතනයෙන් ලබා ගැනීමට නොහැකි විය. මේ වන විට වෙනත් ආයතනයකින් මිල ගණන් කැඳවා අළුත්වැඩියා කටයුතු සිදුකර මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>නිර්දේශය</th><th>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th></tr>
<tr><td>(අ)</td><td>වැලි කැණීම සඳහා මිනරල් සෑන්ඩ්ස් සමාගම වෙත 2017 පෙබරවාරි සිට 2019 අගෝස්තු දක්වා බලපත්‍ර නිකුත් කර තිබූ අතර එම බලපත්‍ර තුනෙහි කොන්දේසි උල්ලංඝනය කරමින් එම සමාගම විසින් වැඩි පුර වැලි කියුබ් 19,096ක් කැණීම් කර තිබුණි. වැඩිපුර වැලි කැණීම හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත අයකර ගත යුතු රු. 9,548,057ක අමතර ගාස්තුව මිනරල් සෑන්ඩ්ස් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
<table>
<tr><th>බලපත්‍ර අංකය</th><th>වැඩි පුර කැණීම් කරන ලද වැලි ප්‍රමාණය</th><th>තවදුරටත් අය කර ගැනීමට ඇති මුදල</th></tr>
<tr><td></td><td>කියුබ්</td><td>රු.</td></tr>
<tr><td>P/17/78</td><td>9321.80</td><td>4,660,900</td></tr>
<tr><td>P/18/86</td><td>3928.67</td><td>1,964,338</td></tr>
<tr><td>P/18/946</td><td>5,846</td><td>2,922,819</td></tr>
</table></td><td>ඛණිජ වැලි කැණීම සඳහා නිකුත් කර ඇති බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කරමින් වැඩිපු කැණීම් කර ඇති ප්‍රමාණයට අදාල මුදල දෙපාර්තමේන්තුවට අයකර ගැනීමට කටයුතු කළ යුතුය.</td><td>එසේම දැනට කැණීම් කිරීම සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අදාල ගැසට් පත්‍රය අනුව මුදල් ගෙවීම සිදු කර ඇත. එහෙත් ශුද්ධ ඛණිජ වැලි ලබා ගැනීමෙන් පසු ඉතිරිය, නැවත වෙරළ තීරය සකස් කිරීමට මුදිහරින බැවින් එම වැලි සඳහා අය නොකිරීමටත්, මුදාහරින ප්‍රමාණයේ විචලතාවයක් ඇති වී තිබේ නම් ඒ සඳහා ගෙවීම් කිරීමටත් එකඟතාවය එල කරන ලදී.</td></tr>
<tr><td>(ආ)</td><td>ඉහත බලපත්‍රයේ 06 වැනි කොන්දේසිය ප්‍රකාරව ඛණිජ වැලි කැණීම් සිදු කිරීමෙන් අනතුරුව නැවතත් එම වෙරළ තීරය මුහුදු වැලි යොදා යථා තත්ත්වයට පත් කිරීම ලංකා මිනරල් සමාගමේ වගකීම වන අතර එය දෙපාර්තමේන්තුවේ සහ සමාගමේ ඉංජිනේරුවරයකුගේ සෘජු අධීක්ෂණය</td><td>බලපත්‍රයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව වැලි කැණීම් සිදු කිරීමෙන් අනතුරුව අදාල ස්ථාන වලට නැවත වැලි පිරවීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසු</td><td>කෙසේ වුවත්, දැනට වෙරළට මුදාහල වැලි සහ කැණීම් කරන වැලි අතර</td></tr>
</table>

| | | |
|---|---|---|
| යටතේ සිදු විය යුතුය. නමුත් සමාගම එවන ලද වාර්තාවලට අනුව මුහුදු වැලි මෙට්‍රික් ටොන් 277,944 ක් පිරිවිය යුතු වුවත් පුරවා ඇත්තේ මෙට්‍රික් ටොන් 119,323 ක් වන අතර මෙට්‍රික් ටොන් 158,621ක ප්‍රමාණයක් තව දුරටත් පිර විය යුතුය | විපරම් කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කළ යුතුය. | විචලතාවයක් පවත්නා බව විගණනයේ දී හෙලි වී ඇති බැවින් අදාල ගැසට් පත්‍රය අනුව ගෙවීම් කටයුතු සිදු කළ යුතු බවට ලංකා මිනරල් සැන්ඩ් සමාගම වෙත දන්වන ලදී. |